INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**මාධ්‍ය නිවේදනය: විමර්ශනය නොකොට සිසිර මෙන්ඩිස්ට තෑගි දීම**

2017 ජූලි 24

**ජොහැන්නස්බර්ග්:** යුද්ධයේ උච්චතම අවධියේ රටේ කුප්‍රකටම වධක අඩවිය පවත්වාගෙන ගිය සිසිර මෙන්ඩිස් ට සේවා දිගුවකින් වරදනයක් ප්‍රදනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සිදුකොට ඇත්තේ වධහිංසාවෙන් පීඩා විඳි අයටත් එක්සත් ජාතීන්ටත් නැවත වතාවක් මහත්සේ අවඥා කිරීමයි. මෙය කර ඇත්තේ රජයේ හා ආරක්ෂක අංශවල නිලධාරීන් පත්කිරීමේදී පූර්ව සෝදිසියක් සිදු කරන බවට කොළඹ ආණ්ඩුව දෙවසරකට ඉහතදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට පොරොන්දු වී තිබියදීය.

*“ඉහල හමුද නිලතල හා තානාපති පදවි වලට පමණක් නොව සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම වෙනුවෙන් පිහිටුවා ඇති ආයතනයට පවා පත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අපරාධ සම්බන්ධයෙන් චෝදනා එල්ලවී ඇතියවුන්ට නිරන්තරයෙන්ම පාරිතෝෂික ලබා දෙමින් සිටී,”* යි ITJP විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පවසයි. *“පීඩිතයන්ට ගරු කිරීමක් ඇත්තේ කොහිද? කිසිදු පරීක්ෂණයකට මුල පුරන්නේ නැතිව කරන ලද මෙම ප්‍රකෝපකාරී ක්‍රියාවෙන් මම තුෂ්නිම්භූත වී සිටිමි.”*

සිසිර මෙන්ඩිස් 2008 මාර්තු සිට 2009 ජූනි දක්වා පොලිස් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ (CID) නියෝජ්‍ය පොලිස්පති වශයෙන් කටයුතු කරද්දී ත්‍රස්තවාදී විමර්ශන ඒකකය (TID) ද ඔහු යටතේ විය. වධ දීමට ප්‍රචලිත “හතරවැනි තට්ටුව” භාරව සිටියේ ඔහුය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2015 දී ප්‍රකාශයට පත් කරන ලද වාර්තාවක මෙන්ඩිස් මහතා නම්කොට තිබුනු අතර වධබන්ධන සඳහා යොදගත් ඔහුගේ මුලස්ථානයේ තිබූ ප්‍රශ්න කරන කාමර “බැට දීම සඳහා යොදගත් යකඩ පොලු සහ මුගුරු, දියේ ගිල්වීම සඳහා යොදගත් වතුර බැරල්, බොලොක්ක සහ මෙවලම්,” (13 ඡේදය) ආදියෙන් සමන්විතව තිබුනි.

විශ්‍රාම ගෙන සිටි මෙන්ඩිස් මහතා සිරිසේන ආණ්ඩුව විසින් ආපසු කැඳවනු ලැබුවේ ජාතික බුද්ධි සේවාවේ ප්‍රධානියා කිරීමටය. මාධ්‍ය වාර්තා අනුව, ඔහුට දැන් තවත් අවුරුද්දක සේවා දිගුවක් ලබා දී තිබේ.

*"මෙය රට තුල දණ්ඩ මුක්තිය පැලපදියම් කිරීමක් හා සමාන වන අතර ශ්‍රී ලංකාව වධහිංසාව අනුමත කරන බවට සංඥවක් නිකුත් කරයි,"* යනුවෙන් යැස්මින් සූකා පැවසුවාය.

පසුගිය නොවැම්බරයේදී ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වධහිංසා පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව (UNCAT) හමුවට ගිය නියෝජිත පිරිසේ සාමාජිකයකු ලෙස මෙන්ඩිස් මහතා ජිනීවා යැවූ විට කමිටුව පැවසුවේ ඔහුගේ පැමිණීමෙන් "තිගැස්සුනු" බවයි. තමන්ගේ අතීතය පිළිබඳ ප්‍රශ්න වලට පිළිතුරු දීමෙන් මෙන්ඩිස් මහතා වැළකී සිටියේය. වධහිංසා දීමට අදාළ චෝදනා සම්බන්ධයෙන් මෙන්ඩිස් මහතාගේ භූමිකාව සහ වගකීම ගැන සවිස්තර තොරතුරු සපයන ලෙසද, ඉහළ නිලතල වලට පත් කිරීම් සඳහා විශ්වසනීය සෝදිසි කිරීම් කාර්යාවලියක් ආරම්භ කරන ලෙසද, 2016 දෙසැම්බරයේ (13 ඡේදය) සිය සමාප්ති නිරීක්ෂණ ඉදිරිපත් කරමින්, කමිටුව ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් නිල වශයෙන් ඉල්ලා සිටියේය.

"මෙන්ඩිස් මහතාට එරෙහි චෝදනා බරපතල ලෙස සැලකිල්ලට නොගැනීම වධහිංසා පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවත්, 2015 විමර්ශනයේදී ඔහු ගැන නමින්ම සඳහන් කළ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයත් නිග්‍රහයට ලක් කිරීමකි. වධහිංසාවට එරෙහි කමිටුව මෙයාකාරයෙන් හැල්ලුවට ලක් කිරීම නොඉවසන බව ජාත්‍යන්තර ප්‍රජාව පැහැදිලිව කියා පෑ යුතුයැ," යි යැස්මින් සූකා ප්‍රකාශ කළාය.

නිමි

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT